## 2019 මාර්තු මස මාසික සභා රැස්වීම

## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

2019 මාර්තු මස මාසික සභා රැස්වීම 2019.03.14 වන දින පෙ.ව. 11.00 ට ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබීය.

එදින සභා රැස්වීමට පහත නම් සඳහන් අය සහභාගී වූහ.

1. ගරු උප සභාපති - ඩබ්ලිව්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එච්.සිරිපාල මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඒ.ගුණතිලක මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ආර්.රත්නපාල මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඒ.ඩබ්ලිව්.සුමනාවතීමැතිතුමිය
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා

### නිලධාරී සහභාගීත්වය

1. ප්‍රාදේශීය සභාවේ ලේකම් - එස්.රත්නාවතී මැණිකේ මෙනවිය
2. සංවර්ධන නිලධාරී - එස්.එච්.එච්.එල්.ජයසූරිය මිය

මෙදින සභා රැස්වීමට සහභාගී වූ ගරු සභාපති තුමා විසින් ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත්,ලේකම් තුමිය ඇතුළු කාර්යමණ්ඩලයත්,මාධ්‍යවේදී මහතාත් පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

## 1. පසුගිය සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම

2019.02.14 මාසික සභා වාර්තාවේ අංක 5.7.(I) හැවැන්දෙනිය සිට ඌරාවල විද්‍යාල මාවත ලෙස සංශෝධනය විය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය ප්‍රකාශ කිරීමෙන් අනතුරුව,2019.02.14වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලදුව එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

## 2. ගරු සභාපතිතුමාගේ නිවේදන

### 2.1. ජල බිල්පතේ නම සංශෝධනය කිරීම

ඒ.එම්.සුගතපාල අතුකෝරල මහතා නමින් NG497 අංක දරණ ජල බිල් පත ඒ.එම්.බුද්ධික ප්‍රසාද් අතුකෝරල මහතා නමින් සංශෝධනය වන බව සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

### 2.2. පාසල් අසල පෞද්ගලික පංති පිළිබඳ ප්‍රචාරාත්මක දැන්වීම් පුවරු ප්‍රදර්ශණය තහනම් කිරීම.

සබරගමුව පළාත් සභාවේ අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් ඉහත මැයෙන් යුතුව නිකුත් කර ඇති අංක සබර/2019/01 දරණ චක්‍රලේඛය සභාවෙ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

## 3. සභාව නමින් ලැබී ඇති ලිපි,පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් කිරීම

### 3.1. නිවාඩු අනුමත කර ගැනීම.

ගරු ප්‍රාදේශීය සභා මනිත්‍රී ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා අසනීප වීම හේතුවෙන් අද දින සභා රැස්වීමට සහභාගී නොවන බව දන්වා එවා ඇති බැවින් ,නිවාඩු අනුමත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු ප්‍රාදේශීය සභා මනිත්‍රිනී එන්.වී.ශ්‍රීමාවති මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් පසුව එම නිවාඩු අනුමත විය.

### 3.2. ඉළුක්කුඹුර හිඳකරල්දෙනියගොඩ මූකලම්හේන ගම්මානයට යන මාර්ගය සකස් කර ගැනීම සම්බන්ධවයි.

ජී.ජී.ධර්මසිරි මහතා ඇතුළු ගම්වාසීන් විසින් ඉහත මාර්ගය පිළිසකර කරදෙන ලෙස ඉල්ලා ලබා දී තිබූ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

**3.3. දීර්ඝ කාලීන බදු බලපත්‍ර යටතේ රජයේ ඉඩම් ලබාදීම සඳහා ප්‍රාදේශීය සභාවේ එකඟතාව ලබා ගැනීම.**

ඉහත කරුණ පිළිබඳව වැලිගෙපොල ප්‍රාදේශීයලේකම්ගේ අංක WEDS/LND/7/LEASE/1/4/7 හා 2019.02.26 දිනැති ලිපිය හා අංක WEDS/LND/7/LEASE/1/4/13හා 2019.03.01 දිනැති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.එහිදී සියළු ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස වූයේ ඉල්ලුම්කරු හා පදිංචිකරුද යන්න කාර්මික නිලධාරී වාර්තාවක් ලබාගෙන එකඟතාව ලබා දීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

**3.4. ගම්පෙරළිය - වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන (RRDP) -2019**

ඉහත කරුණ පිළිබඳව වැලිගෙපොල ප්‍රාදේශීයලේකම්ගේ අංක WEDS/LND/7/LEASE/1/4/7 හා 2019.02.26 දිනැති ලිපිය හා අංක WEDS/PLD/DV/3/RRDP/1/2/3/2019 හා 2019.03.05 දිනැති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

## 4. <u>යථාපරිදිකල්දීඇතිප්‍රශ්න</u>

යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න කිසිවක් නොවීය.

## 5. <u>කල්දීඇතියෝජනා</u>

### 5.1. <u>ගරුසභාපතිකැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා</u>

ගරු සභාපතිතුමා විසින් පහත යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. ත්‍රීවිල් රථ ගාස්තු අයකර ගැනීමට අදාලව අනුමත කරන ලද ත්‍රීරෝද රථ සඳහා ලාංඡනයක් ලබා දීමට සහ අනුමත කරන ලද ත්‍රීරෝද රථ ප්‍රමාණය ඇතුලත් කර දැන්වීම් පුවරුවක් රථගාලේ ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය බවත්,

II. ගල්හිර පල්ලෙවෙල ගෙදර හරහා නවංගොඩ දක්වා දිවෙන මාර්ගය හේතුවෙන් කැඩිගිය උපාලි මහතාගේ නිවසේ බැම්ම බැදීම සඳහා රු300,000/= ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවත්,

III. කසළ මධ්‍යස්ථානය වෙනුවෙන් වෙන්කරන ලද ඉඩමේ කොම්පෝස්ට් නිෂ්පාදනාගාරයක් ,නොදිරන බඳුන් එකතු කරන ස්ථානයක් හා මල අපද්‍රව්‍ය පිරිපහදු මධ්‍යස්ථානයක් ඉදිකිරීම අවශ්‍ය බවත්,යෝජනා කරන ලදී

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර ලදී.

සිය පළමු යෝජනාව සම්බන්ධව අදහස් දැක්වූ ගරු සභාපතිතුමා ,ත්‍රීරෝද රථ අතුරු ව්‍යවස්ථාවට අනුව බල ප්‍රදේශයේ පවතින ත්‍රීරෝද රථ සංගම් රියදුරන් සමඟ සාකච්ඡා කර එවා ලියාපදිංචි කිරීමත්, එහි විස්තර හා ලියාපදිංචි ත්‍රීරෝද රථ වෙනුනේ මාසිකව රු.100/= ක මුදලක් අයකිරීමටත් තීරණය කල බවත් ප්‍රකාශ කරන ලදී.
තවද,කසළ මධ්‍යස්ථානයක් ,කොම්පෝස්ට් නිෂ්පාදනාගාරයක් හා මල අපද්‍රව්‍ය පිරිපහදු මධ්‍යස්ථානයක් ඉදිකිරීමට අදාලව ජලාප්‍රවාහන මණ්ඩලයෙන් කල ඉල්ලීමකට අනුව මෙම සභාව වෙනුවෙන් පහසුකම් සැලසීමට එකඟ වී ඇති අතර ඒ සම්බන්ධව සාකච්ඡාවක් ප්‍රාදේශීය ලේකම්, මහජන සෞඛ්‍ය පරීක්ෂක, හා පරිසර අධිකාරිය එක්ව මෙම සභාවේදී සිදු කිරීමට නියමිත බව ප්‍රකාශ කරන ලදී.අනතුරුව ගරු සභාපතිතුමාගේ ඉහත යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපතිතුමා විසින් හදිසි යෝජනා ලෙස පහත යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.

**IV.** ඕපනායක නගරයේ ඉදිකිරීමට නියමිත හෙල බොජුන් හලේ සැලසුම්පත් හා දල ඇස්තමේන්තුව සඳහා සභා අනුමැතිය අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේම කුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ සම්බන්ධව අදහස් දැක්වූ ගරු සභාපතිතුමා ,නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)කාර්යාලය මඟින් ඕපනායක නගරයේ ඉදිකිරීමට නියමිත හෙල බොජුන්හල සම්බන්ධව සැලසුම් සකස් කර ඇති බවත්,එහි දළ වියදම මිලියන විස්සක් පමණ වන බවත් ,කොළඹ බදුල්ල මාර්ගයේ වැසිකිළි පද්ධතියක් සඳහා විශාල මුදලක් වෙන්කර ඇතිබවත් බොජුන් හල සමග එය ඉදිකිරීමෙන් විශාල ආදායමක් සභාවට උපයා ගත හැකිවන බවත් ගරු සභාපතිතුමා විසින් පැහැදිලි කරන ලදී.

මේ සම්බන්ධව පැවති විවාදයේදී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් වන එච්.ඒ.දමිත් විජේරත්න, ඒ.එම්.අයි.පී.රණතුංග, ටී.සී.එස්.කේ.ඉසුරුමුණි,ඩී.බුද්ධික වීරසිංහ,යන මන්ත්‍රීතුමන්ලාගේ අදහස වූයේ හෙල බොජුන් හල සඳහා ණය ලබාගෙන ඒවා ගෙවීමේ හැකියාවක් සභාව සතුව පවතීද යන්නයි.ප්‍රාදේශීය සභා මන්ත්‍රී බුද්ධික වීරසිංහ මැතිතුමා අදහස දක්වමින්, ව්‍යාපෘතියේ කොටසක් පමණක් සිදුකර එහි සාර්ථකත්වය බලා ඉතිරි වැඩ කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීටී.සී.එස්.කේ.ඉසුරුමුණි මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා ණය වාරිකය හා ආදායම සසදා වාර්තාවක් ලබා ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමාගේ අදහස වූයේ බදු දී මෙය ඉදිකර සභාවට පවරා ගැනීමක් කිරීම සුදුසු බව දක්වන ලදී.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය ආහාර පාන වලට අමතරව ඔසු පැළ හා දේශීය දේ විකිණීමටත් කොටසක් වෙන් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

සංචාරක කලාපයක් ලෙස දියුණු කිරීමට නිමිත මෙම ප්‍රදේශයේ මෙවන් ව්‍යාපෘතියක් තුලින් අනාගතයේදී සභාවට විශාල ආදායමක් උපයා ගත හැකි බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.අනතුරුව මෙම යෝජනාව සම්බන්ධ අවසාන තීරණය වූයේ හෙළ බොජුන් හලෙන් ඉපයීමට අපේක්ෂිත ආදායමත්, ණය වාරිකයත් සසදා ව්‍යාපෘති වාර්තාවක් සකස් කර ණය වාරිකය ගෙවීමට ප්‍රමාණවත් ආදායමක්

ලබාගැනීමට හැකියාවක් පවතී නම් එය ඉදිකිරීම සුදුසු බවට තීරණය විය.ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 5.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. අකරුල්ල වතු ක්‍රිඩා පිටිය පස් කපා පුළුල් කිරිම අවශ්‍ය බවත්,
II. අකරල්ල කොට්ඨාශයට යෝජනා වු ස්ථාන වලට විදී පහන් සවි කිරිම අවශ්‍ය බවත්, යෝජනා කරන ලදී.

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

## 5.3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා

I. හල්ලින්න - පොල්බොක්ක ප්‍රජා ශාලාවට විදුලිය ලබා දිම අවශ්‍ය බවත්,
II. දකුණු හුණුවල ලෙන්දර ක්‍රිඩා පිටියේ වැඩ අවසන් කිරිම අවශ්‍ය බවත්,
III. දොඹගස්වත්ත කැබෙල්ලකැටිය ජල උල්පතට මෝටර් යොදා ජලය ලබාගෙන හල්ලින්න වසමේ ජල හිඟය නිරාකරණය කිරිම සුදුසු බවත්,ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

## 5.4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. තලගහවත්ත මාර්ගය කොන්ක්‍රිට් කිරිම සඳහා රු 250,000/= ක ඇස්තමේන්තුව අනුමත කර ගැනීම අවශ්‍ය බවත්,
II. ගල්ලනකන්ද මාර්ගය කොන්ක්‍රිට් කිරිම සුදුසු බවත්,
III. මොරවිටිවල බෝගහ අසළ ඇති මාර්ගය මාර්ගය කොන්ක්‍රිට් කිරිම සුදුසු බවත්,
IV. පොල්බොක්ක පිටවත්ත මාර්ගය කොන්ක්‍රිට් කිරිම සුදුසු බවත්,
V. පොල්බොක්ක ප්‍රේමසිරි මහතාගේ නිවස ඉදිරිපිට ඇති ජල නල මාර්ගයෙන් ඉදිරි නිවෙස් සඳහා ජලය ලබා දිම සුදුසු බවත්,
VI. පහලවෙල ගල්ලෙකුඹුර මාර්ගයේ සුසානභූමි මාර්ගය පිහිටි නිවාස සඳහා ජලය ලබා දිම අවශ්‍ය බවත්,
VII. පහලවෙල මාර්ගය කොන්ක්‍රිට් කිරිම අවශ්‍ය බවත්,
VIII. හල්ලින්න තැන්න මාර්ගය කොන්ක්රිට් කිරිම අවශ්‍ය බවත්, යෝජනා කරන ලදී.

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 6. <u>කාරක සභා වාර්තා සලකාබැලීම.</u>

### 6.1.2019.02.14 වන දින හා 2019.02.26 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාව

කාරක සභාවේ තීරණ අංක 377 සිට 427 දක්වා වූ වියදම් එදින කාරක සභාවට යොමු කරන ලද අතර,එම වියදම් මහ සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 7. ආදායම් වියදම් වාර්තා

### 7.1. 2019 ජනවාරි මස ආදායම් වියදම් වාර්තාව

| ලැබීම් සාරාංශය (රුපියල්) | | වැය සාරාංශය (රුපියල්) | |
|---|---|---|---|
| වරිපනම් බදු | 1,194,937.43 | වැටුප් හා දීමනා | 2,155,418.97 |
| කුලී | 57,238.94 | ගමන් වියදම් | - |
| බලපත්‍ර ගාස්තු | 21,004.00 | සැපයුම් හා උපකරණ | 23,886.80 |
| සේවා සඳහා ගාස්තු | 199,066.65 | ප්‍රාග්ධන වත්කම්අළුත්වැඩියාහා නඩත්තුව | 59,269.29 |
| වරෙන්තු ගාස්තු | 4,078.25 | ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 7,390.40 |
| වෙනත් ආදායම් | 42,846.11 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | - |
| වෙනත් ආධාර | 2,168,070.26 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | - |
| පුනරාවර්ථන ආදායම් එකතුව | 3,687,241.64 | විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ,හා පාරිතෝෂික | - |
| මූලධන ලැබීම් | - | පුනරාවර්තන වියදම් එකතුව | 2,245,965.46 |
| ප්‍රාග්ධන ආදායම් එකතුව | - | ප්‍රාග්ධන වැය | 79,000.00 |
| පුනරාවර්ථන ප්‍රාග්ධනආදායම් එකතුව | 3,687,241.64 | ණය ආපසු ගෙවීම් | - |
| සේවක ණය | 33,812.78 | සේවක ණය | 144,000.00 |
| තැන්පත් | 73,533.31 | තැන්පත් | 52,909.07 |
| අත්තිකාරම් | 19,555.59 | ණයහිමි | 562,876.31 |
| ණය ගැති(කර්මාන්ත) | 88,299.53 | අත්තිකාරම් | - |
| සමුච්චිත අරමුදල | - | ජල ගබඩා | - |
| | | ගබඩා(ඖෂධ) | - |

| | | | |
|---|---|---|---|
| වෙනත් ලැබීම් එකතුව | 215,201.21 | සමුච්චිත අරමුදල | 73,769.16 |
| | | වෙනත් ගෙවීම් | - |
| | | වෙනත් ගෙවීම් එකතුව | 833,554.54 |
| මුළු එකතුව | 3,902,442.85 | මුළු ගෙවීම් | 3,158,520.00 |

## 7.2. 2019 ජනවාරි 31 දිනට ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තා

| අනු අංකය | ආදායම් ප්‍රභවය | 2018.12.31 ට හිඟ | 2019 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | 2019.01.31 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරීමට ඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
| 1 | වරිපනම් බදු 1.11 | 5689897 | 1940000 | **161928** | **3%** | **454145** | **23%** | **1485855** | 5527969 |
| 2 | අක්කර බදු 1.12 | 76927 | 20900 | **0** | **0%** | **689** | **3%** | **20211** | 76927 |
| 3 | සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීම1.43 | | 200000 | | | **22350** | **11%** | **177650** | |
| 4 | ව්‍යාපාර බදු 2.16 | | 267600 | **-** | | **22200** | **8%** | **245400** | |
| 5 | වෙළෙඳ බලපත්‍ර ගාස්තු2.31 | 13000 | 808000 | **13,000** | | **21000** | **3%** | **787000** | - |
| 6 | පරිසර බලපත්‍ර ගාස්තු2.37 | | 30000 | | | **0** | **0%** | **30000** | |
| 7 | ලියාපදිංචි සහතික හා පරීක්ෂණ ගාස්තු | | 467000 | | | **6562** | **1%** | **460438** | |
| 8 | ජල ගාස්තු 4.14 | 1521564 | 6705000 | **548751** | **36%** | **7225** | **0%** | **6697775** | 972813 |
| 9 | විකුණුම් | | 564500 | | | **38786** | | | |
| 10 | යන්ත්‍ර කුළියට දීම3.25(2)/3.25(3) | | 845500 | | | **0** | **0%** | **845500** | |
| 11 | වාහන නැවතුම්පල ගාස්තු 5.43 | | 300000 | | | | **0%** | **300000** | |
| 12 | ගොඩනැඟිලි බලපත්‍ර3.43(4) | | 300000 | | | **58155** | **19%** | **241845** | |
| 13 | පොදු වෙළඳපල කුළී | | | | | | | | |
| 14 | මස්කඩ මාළු කඩ කුලී 5.23(2) | 183158 | 463200 | **0** | **0%** | **0** | **0%** | **463200** | 183158 |
| 15 | ප්‍රමාද ගාස්තු | | 94000 | | | **2053** | **2%** | **91947** | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 16 | විනෝද බදු 6.15 | | 1000 | | | - | 0% | 1000 | |
| 17 | සතිපොළ ගාස්තු5.23(1) | 16925 | 254000 | 0 | 0% | 18780 | 7% | 235220 | 16,925 |
| 18 | බොජුන් හල සඳහා ගාස්තු5.23(3) | | | | | 0 | | | |
| 19 | දැන්වීම් පුවරු ගාස්තු1.37 | | 400000 | | | 0 | 0% | 400000 | |
| 20 | ජල බවුසරය කුළියට දීම 4.25 | | 300000 | | | 10500 | 4% | 289500 | |
| 21 | ක්‍රීඩා පිටිය කුලියට දීම 6.25 | | 2000 | | | 0 | 0% | 2,000 | |
| 22 | වෘත්තීයබලපත්‍ර 1.33 | | 100 | | | - | 0% | 100 | |
| 23 | පොලීආයෝජන 1.61 | | 500 | | | | 0% | 500 | |
| 24 | සේවකණයපොලී1. 64 | | 40000 | | | 4060 | 10% | 35940 | |
| 25 | අයකරගතහැකිගාස් තු2.43 | | 25000 | | | 0 | 0% | 25000 | |
| 26 | සභාවසතුගොඩනැගි ලි3.25.1 | | 1000 | | | - | 0% | 1000 | |

| අනු අංකය | ආදායම් ප්‍රභවය | 2018.12.31 ට හිඟ | 2019 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | 2019.01.31 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරිමට ඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
| 27 | දඩඅනවසරඉදිකිරීම් 3.52 | | 500 | | | - | - | 500 | |
| 28 | අයකරගතහැකිගාස් තු 4.43 | | 1000000 | | | 96500 | 10% | 903500 | |
| 29 | විශේෂසැපයුම්සඳහා ගාස්තු4.16 | | 5000 | | | - | - | 5000 | |
| 30 | පොළභූමියකුලියටදී ම5.25 | | 1000 | | | - | - | 1000 | |
| 31 | ක්රීඩාපිට්ටකරන්මඩු කුලියටදීම6.25 | | 2000 | | | 0 | 0% | 2000 | |
| | වෙනත් ආදායම්* | 0 | 878140 | 0 | 0% | 45528 | 0% | 832612 | |
| | මුළු එකතුව | 7471546 | 15915940 | 723679 | 10% | 808533 | 5% | 14581693 | 6777792 |

වෙනත්ආදායම්*

| අනු අංකය | ආදායම් ප්‍රභවය | 2018.12.31 ට හිඟ | 2019 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | 2019.01.31 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරිමට ඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
| 1 | ලියාපදිංචි කිරීමේ සහතික හා පරීක්ෂණ ගාස්තු | | | | | | | | |
| 2 | ඉඩම් හා ගොඩනැගිලි බදු දීම් | | | | | | | | |
| 3 | පා පැදි බලපත්‍ර 1.35 | | 150 | | | 4.00 | 3% | 146 | |
| 4 | වරිපනම් සංශෝධන ගාස්තු | | | | | | | | |
| 5 | වැසිකළි කුලියට දීම | | | | | | | | |
| 6 | කසල ඉවත් කිරීමේ ගාස්තු 2.13 | | 107000 | - | | - | 0% | 107000 | - |
| 7 | සභා භූමිය කුලියට දීම | | | | | | | | |
| 8 | පාරවල් පළුදු වීම වෙනුවෙන් ගාස්තු | | | | | | | | |
| 9 | නොපවරවා ගැනීමේ සහතික ගාස්තු 3.43.(1) | | 200000 | | | 15500 | 8% | 184500 | |
| 10 | පුස්තකාල සේවා ගාස්තු 6.43 | | 15000 | | | 40 | 0% | 14960 | |
| 11 | පුස්තකාල දඩ 6.52 | | 20000 | | | 2025 | 10% | 17,975 | |
| 12 | ඉඩම් විකිණීම මත බදු | | | | | | | | |
| 13 | ඉඩම්බදු 3.24 | | 448390 | 0 | | 20442 | 5% | 427948 | - |
| 14 | වෙළෙඳ ස්ථාන කුලී03.22 | | 87600 | | | 7517 | 9% | 80,083.1 | |
| | එකතුව | 0 | 878140 | 0 | 0% | 45528 | | 832612 | - |

## 8. පසුගිය සභා රැස්වීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම

පසුගිය සභා රැස්වීමට ඉදිරිපත් වූ යෝජනා විෂය නිලධාරීන් වෙත යොමුකර ඇති බව ප්‍රකාශ කරන ලදී.

## 9. වෙනත් කරුණු

තලගස්කන්ද ක්‍රීඩා පිටිය සභාවට පවරාගෙන එය සංවර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසත්,මේ වන විට එම භූමිය නිවාස ඉදිකිරීම් කටයුත්තක් වෙනුවෙන් යොදා ගෙන ඇති අතර ඉදිකිරීම් සභාවේ අනුමත කර නොමැති බවත්,එයට ප්‍රදේශ වාසීන්ගේද විරෝධතා ඇති බැවින් හා වැලිගෙපොල ප්‍රදේශයට පවතින එකම ක්‍රීඩා පිටියද මෙය වන බැවින් ,ඒ සම්බන්ධව නිවාස සංවර්ධන අධිකාරියට හා ප්‍රාදේශීය ලේකම් දැනුවත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමන්ලා  වෙනුවෙන් හා ප්‍රදේශයේ ක්‍රීඩා සමාජ වෙනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි සමන්ජීව මැතිතුමා ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධව කරුණු දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමිත් විජේරත්න මැතිතුමා ,මැනීම් කිරීමේදී පර්චස් 30ක ප්‍රමාණයක් ක්‍රීඩා පිටිය වෙනුවෙන් වෙන් කර ඉතිරි කොටසේ මෙම නිවාස ව්‍යාපෘතිය සිදු කරන බව ප්‍රකාශ කරන ලදී.නිවාස ව්‍යාපෘතියක් ආරම්භ කිරීම යහපත් ක්‍රියාවක් වුවත්,මෙම භූමි ප්‍රමාණය ක්‍රීඩා පිටියකට හා කර්මාන්තයකට වෙන් කර තිබූ බවත්, කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීම තුලින් ප්‍රදේශයේ රැකියා ගැටළුවලට විසඳුමක් ලැබෙන බවත් ,යම් ඉදිකිරීමක් හෝ ඉඩම් කට්ටි කිරීමක් සිදුකරන්නේ නම් සභාවේ අනුමත කලයුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා ප්‍රකාශ කරන ලදී.ක්‍රීඩා පිටියක අවශ්‍යතාව  පවතින බැවින් මෙම ඉඩමේ අයිතිය හඳුනාගෙන එය සභාවට පවරා ගැනීමට කටයුතු කල යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.එස්.ඉසුරුමුණි මැතිතුමා සඳහන් කරන ලදී.

තලගස්කන්ද ක්‍රීඩා පිටිය 2013.06.14 පොදු කටයුතු සඳහා ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට හිටපු සභාපති විජේරත්න මැතිතුමාද කටයුතුකර ඇති බව සඳහන් කල ගරු සභාපතිතුමා ප්‍රකාශ කලේ ක්‍රීඩා පිටියට අවශ්‍ය කොටස වෙන්කර ඉතිරි කොටස නිවාස ව්‍යාපෘතිය සඳහා යොදා ගන්නා ලෙස ප්‍රාදේශීය ලේකම් හා නිවාස සංවර්ධන අධිකාරිය වෙත ලිපි යොමුකල නමුත් මේ සම්බන්ධව කිසිදු විනිවිද භාවයක් නොපෙන්වන බවත්,කිසිදු දේශපාලන වාසියක් අපේක්ෂා නොකර මෙම කටයුත්ත වෙනුවෙන් පෙනී සිටිය යුතු බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.මේ සඳහා ජනත හිතවාදී විසඳුමක් ලබා ගැනීමට නම් නිවාස සංවර්ධන අධිකාරිය,ප්‍රාදේශීය ලේකම් හා දේශපාලන අධිකාරිය එක්ව සාකච්ඡා කිරීමෙන් පමණක් ලබා ගත හැකිවෙතැයි වැඩි දුරටත් සඳහන් කරන ලදී.

උඩවෙල සිට අම්බැවිල දක්වා මාර්ගය සංවර්ධනය කරගැනීම වෙනුවෙන් පැවති විරෝධතාවට සහය දැක්වූ සියළු පක්ෂවල ගරු මන්ත්‍රීතුමන්ලාට සිය ස්තූතිය පලකල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.එස්.ඉසුරුමුණි මැතිතුමා එහි පළමු අධියර ලෙස උඩගම සිට රංවල හන්දිය දක්වා මාර්ගය සංවර්ධනය කර ගැනීමට සියළුදෙනා එක්ව උත්සහ කල යුතු බව ප්‍රකාශ කරන ලදී.

## සභා රැස්වීමේ නිමාව

උඩරංවල මාර්ගයේ විරෝධතාවට සිය සහයෝගය දැක්වීමට හදිසි කටයුත්තක් හේතුවෙන් සහභාගීවීමට නොහැකි වුවත් සිය සහය ඒ සඳහා ලබා දෙන බවත්,මාර්ග රැසක් අබලන්වීමට ප්‍රධාන හේතුව පසුගිය වකවානුවේ මාර්ග නිසි ලෙස නඩත්තු නොකිරීම බව පෙන්වා දුන් ගරු සභාපතිතුමා ,අද දින සභාවේ කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා සහය දැක්වූ සියලු දෙනාටම ස්තූතිය පල කරමින් සැමට සුභ දවසක් ප්‍රාර්ථනා කර සභාවේ කටයුතු පස්වරු 01.15ට පමණ නිමාවට පත්කරන ලදී.

කැළුම් ප්‍රියංකර ජයසිංහ,

සභාපති,

වැලිගෙපොල ප්‍රාදේශීය සභාව